**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය ඉලුක්කේවෙල ධම්මරතන හිමි**
(BA (hons), MA, MPhil.)
බෞද්ධ දර්ශනය අධ්‍යයනාංශය
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.

# ධනෝපාර්ජනය පිළිබඳ බෞද්ධ විග්‍රහය

බෞද්ධ ආර්ථික චින්තනය විමුක්ති සාධනය පදනම් කොට ගත්තකි. මිනිසාගේ ලෞකික හා ලෝකෝත්තර අභිමතාර්ථ පූරණය වන අයුරින් ගොඩනැගී ඇති යම් අර්ථ ක්‍රමයක් වේ නම් එය බෞද්ධ ආර්ථික චින්තනය යැයි හඳුන්වා දිය හැකිය. ජීවී-අජීවී සියලු ක්‍රියාකාරකම්හි යහපත් සංවර්ධනය සඳහා උපකාරීවන අයුරින් මෙම අර්ථ ක්‍රමය ඉදිරිපත් වී තිබීම මෙහි ඇති සුවිශේෂත්ය යි. තිරසර සංවර්ධනයක් සඳහා වන බෞද්ධ ආර්ථික චින්තනය මිනිසා ආත්මාර්ථයේ සිට පරාර්ථය කරා රැගෙන යන්නකි. අභිධ්‍යාවෙන් අනභිධ්‍යාවට රැගෙන යන්නකි. අනාර්යයන් ආර්යයන් බවට පත් කරන්නකි. එබැවින් මෙම චින්තනය කර්මය, පුනර්භවය, අත්නොහැර පටිච්චසම්පන්නව නිර්වානගාමී ප්‍රතිපදාව පූරණය පහසු වන පරිදි සකස් වූ සර්වකාලීන ඉගැන්වීමකි. ආර්ථික චින්තනය සම්බන්ධ එම කරුණු මූලික තේමා තුනක් යටතේ ගොනුකොට දැක්විය හැකිය.

1. නිෂ්පාදන දර්ශනය
2. පරිභෝජන දර්ශනය
3. සංරක්ෂණ දර්ශනය

මෙම ලිපියේ දී අපගේ අවධානය යොමු වන්නේ නිෂ්පාදන කාර්යයෙහි ලා අන්තර්ගත වන ධනෝපාර්ජනය හෙවත් මුදල් ඉපයීම පිළිබඳ බෞද්ධ විග්‍රහය විමසා බැලීමයි.

නිෂ්පාදන කාර්යයෙහි අරමුණ වන්නේ මුදල් ඉපයීමයි. ඒ සඳහා යොදා ගත හැකි ජීවනෝපායයන් කිහිපයක් ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි දක්වා ඇත. ඒ අනුව, ධනෝපාර්ජනය සඳහා සුදුසු රැකියා කිහිපයකි.[1]

1. කසියා - කෘෂිකර්මාන්තයෙහි නියැලීම
2. වණිජ්ජාය - වෙළඳාමෙහි නියැලීම
3. ගොරක්ඛෙන - සත්ත්ව පාලනයෙහි නියැලීම
4. ඉස්සත්ථෙන - ශිල්පයක නියැලීම
5. රාජපොරිසෙන - රාජ්‍ය සේවය නියැලීම
6. සිප්පඤ්ඤතරෙන - අධ්‍යයන ක්ෂේත්‍රයෙහි නියැලීම

[1] ව්‍යග්ඝපජ්ජ සුත්ත, අ.නි. 5, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 236 පිටුව

ඉධ ව්‍යග්ඝපජ්ජ කුලපුත්තො යෙන කම්මට්ඨානෙන ජීවිකං කප්පෙති, යදි කසියා, යදි වණිජ්ජාය යදි ගොරක්ඛෙන යදි ඉස්සත්ථෙන යදි රාජපොරිසෙන යදි සිප්පඤ්ඤතරෙන.

ඉහත දක්වන ලද ජීවනෝපායයන් අතරින් බුදුරජාණන් වහන්සේගේ වැඩි අවධානය යොමු වූවකි වෙළඳාම. විශේෂයෙන් උපාසකයෙකු විසින් සිදු නොකළ යුතු වෙළඳාම් ක්‍රම පහක් පිළිබඳ ව වණිජ්ජා සූත්‍රයේ දී දක්වා ඇත. [2]

1. සත්‍ථවණිජ්ජා - ආයුධ වෙළඳාම
2. සත්තවණිජ්ජා - සතුන් වෙළඳාම
3. මංසවණිජ්ජා - මස් වෙළඳාම
4. මජ්ජවණිජ්ජා - මත් ද්‍රව්‍ය වෙළඳාම
5. විසවණිජ්ජා - විෂ ද්‍රව්‍ය වෙළඳාම

මෙකී වෙළඳාම් නිමිති කොට ගෙන පරිසරයට විවිධ බලපෑම් සිදුවිය හැකි බැවින් ද මිනිස් ජීවිත හා සත්ත්ව ජීවිත මෙමගින් විනාශවන බැවින් ද තෙරුවන් සරණ ගිය කිසිවෙකුත් මෙකී වෙළඳාම්හි නියැලීම සුදුසු නො වන බව පෙන්වා දී ඇත.

බුදුරජාණන් වහන්සේ ද උන්වහන්සේගේ පූර්ව ආත්මභාවයන්හි දී පහත සඳහන් වන මිච්ඡා ආජීවයෙන් වැළකුනු බව ලක්ඛණ සූත්‍රයේ දී පෙන්වා දෙයි.

- තුලාකූට - තරාදි ආදියෙන් වංචා කිරීමය
- කංසකූට - රන් හා නොරන් මිශ්‍රකොට වංචා කිරීමය
- මානකූට - වී ආදිය මැනීමෙන් වංචා කිරීමය
- උක්කොටන - හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැනීමය (පාතාල ක්‍රියා)
- වඤ්චන - උපායෙන් අනුන් රැවටීමය
- නිකති - යකඩ ආදී ලෝහ රන් රිදීයයි අඟවා වංචා කිරීමය
- සාචියොග - නොයෙක් ආකාර වූ කපටි ප්‍රයෝගය
- ඡෙදන - කැපීමය, මැරීමය
- වධබන්ධන - වධ දීම්, බන්ධනය
- විපරාමොස - සැඟවී සිට වස්තු පැහැර ගැන්මය (සොරකම)
- ආලොප - ගම් නියම්ගම් ආදිය පැහැරීම (මංකොල්ලය)
- සහසාකාරා - බලහත්කාරයෙන් වස්තු ගැනීමය (කොල්ලකෑම)

එපමණක් ද නොව, පූර්ව ආත්මභාවයන්හි වැරදි ජීවිකාවන්ගෙන්, වංචාවෙන් සිදුකරනු ලබන වෙළඳාමෙන් වැළකී කටයුතු කිරීමේ ප්‍රතිඵල වශයෙන් උන්වහන්සේ ස්වර්ගලෝකයෙහි උපත ලද බවත් එහි දී අන්‍ය වූ දෙවියන්ට වඩා කරුණු දහයකින් උසස් වූ බවත් ලක්ඛණ සූත්‍රයෙහි දක්වා ඇත. එමෙන් ම මෙම ආත්මභාවයේදී ද දෙයාකාර වූ මහාපුරුෂ ලක්ෂණඃ සම දත් ඇත්තේ, අතිශයින් සුදු වූ දත් ඇත්තේ ද ඇති වූ බව එම සූත්‍රයේ දී පෙන්වා දී ඇති අතර

---

[2] වණිජ්ජා සුත්ත, අ.නි. 3, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 338 පිටුව
පඤ්චිමා භික්ඛවෙ, වණිජ්ජා උපාසකෙන අකරණියා, කතමා පඤ්චඃ සත්‍ථවණිජ්ජා, සත්තවණිජ්ජා, මංසවණිජ්ජා, මජ්ජවණිජ්ජා, විසවණිජ්ජා.

යම් හෙයකින් ගිහි ව සිටියේ නම් සක්විති රජ බවට පත් ව සප්ත රතන ලැබීම සඳහා ද එය හේතුවන බව පෙන්වා දෙයි.[3]

මහාචත්තාරීසක සූත්‍රයෙහි ආර්ය අෂ්ටාංගික මාර්ගය පිළිබඳ එන විස්තරයේ දී සම්මා ආජීවය යන්න විග්‍රහ කරයි. එහි මිච්ඡා ආජීවය හඳුන්වා ඇත්තේ කුහනා, ලපනා, නෙමිත්තිකතා, නිප්පේසිකතා, ලාභෙන ලාභං නිජිගිංසනතා වශයෙනි.[4]

- කුහනා - කුහකකම්
- ලපනා - වචනයෙන් කරන රැවටිලි
- නෙමිත්තිකතා - බොරුවට කෙරෙන ඇඟවීම්
- නිප්පේසිකතා - ඇනුම්පද කීම
- ලාභෙන ලාභං නිධිගිංසනතා - ලාභය එකම අරමුණ කරගෙන කෙරෙන කටයුතු

මෙම කරුණු වෙළඳාම සඳහා ඍජු ලෙස අයත් නොවන අතර ඕනෑ ම අයෙකු මෙම කරුණුවලින් තොර ව කටයුතු කරන්නේ නම් හෙතෙම ආර්ය ශ්‍රාවකයෙකු බවට පත්වන බව විස්තර වේ. මේ පිළිබඳ දීර්ඝ විස්තරයක් විශුද්ධි මාර්ගයෙහි ද දක්නට ලැබේ.

ව්‍යාග්ගපජ්ජ සූත්‍රයේ දී කාමභොගී පුද්ගලයා සාහසික නොවී ධාර්මික ව භෝග සොයා සපයා ගත යුතු බව දක්වයි.[5] එහි දී පුද්ගලයාගේ හිත සුව පිණිස පවත්නා කරුණු හතරක් පෙන්වා දෙයි.[6] එනම්,

1. උට්ඨානසම්පදා - උත්සාහ සම්පත්තිය
2. ආරක්ඛසම්පදා - ආරක්ෂා සම්පත්තිය
3. කල්‍යාණමිත්තතා - කල්‍යාණ මිත්‍ර සම්පත්තිය
4. සමජීවිකතා - සමබර ජීවන සම්පත්තිය යි

උට්ඨානසම්පදා යන්න විස්තර කරමින් තමා විසින් කරනු ලබන යහපත් වෘත්තිය සිදු කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග හඳුන්වා දෙයි.[7]

---

[3] ලක්ඛණ සූත්ත, දී.නි. 3, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 282 පිටුව
යම්පි, භික්ඛවෙ, තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො මිච්ඡාආජීවං පහාය සම්මාආජීවෙන ජීවිකං කප්පෙසි, තුලාකූට කංසකූට මානකූට උක්කොටන වඤ්චන නිකති සාචියොග ඡෙදන වධබන්ධන විපරාමොස ආලොප සහසාකාරා පටිවිරතො අහොසි.

[4] මහාචත්තාරීසක සූත්ත, ම.නි. 3, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 218 පිටුව
කතමො ච, භික්ඛවෙ, මිච්ඡාආජීවො? කුහනා, ලපනා, නෙමිත්තිකතා, නිප්පෙසිකතා, ලාභෙන ලාභං නිජිගිංසනතා.

[5] කාමභොගී සූත්ත, අ.නි. 6, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 316 පිටුව
ධම්මෙන භොගෙ පරියෙසති, අසාහසෙන

[6] ව්‍යග්ගපජ්ජ සූත්ත, අ.නි. 5, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 236 පිටුව
චත්තාරො මෙ ව්‍යග්ඝපජ්ජ, ධම්මා කුලපුත්තස්ස දිට්ඨධම්මහිතාය සංවත්තන්ති දිට්ඨධම්මසුඛාය. කතමෙ චත්තාරොඃ උට්ඨානසම්පදා, ආරක්ඛසම්පදා, කල්‍යාණමිත්තතා, සමජීවිකතා.

[7] ව්‍යග්ගපජ්ජ සූත්ත, අ.නි. 5, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 236 පිටුව
තත්‍ථ දක්ඛො හොති අනලසො තත්‍රුපායාය වීමංසාය සමන්නාගතො අලං කාතුං අලං සංවිධාතුං

දක්ෂ ව (දක්ඛො), අනලස් ව (අනලසො), උපායමාර්ග විමසා බලා (තත්‍රූපාය විමංසාය සමන්නාගතො), තෙමේ ම කාර්ය කිරීමේ සමත්කම ඇති ව (අලං කාතුං), සංවිධාන ශක්තියෙන් යුක්තව (අලං සංවිධාතුං) කටයුතු කළ යුතු බව එහි දැක්වෙයි.

විශේෂයෙන් මිල මුදල් ඉපයීමේ දී මලෙන් රොන් ගන්නා වූ බඹරෙකු මෙන් අනුන්ට පීඩාවක් නැති ව වස්තුව රැස් කළ යුතු බවත් එවිට ඔහුගේ සම්පත් රැස්වීමට හෙවත් වර්ධනයට පත්වන බවත් සිඟාලෝවාද සූත්‍රයෙහි පෙන්වා දෙයි.[8]

එපමණක් ද නොව ධාර්මික ව, උට්ඨාන වීර්යයෙන් (උට්ඨානවිරියාධිගතා), දෑතේ මහන්සියෙන් (බාහාබල පරිචිතා), දහදිය හෙළීමෙන් (සෙදාවක්ඛිත්තා) උපයන වස්තුව රජුගෙන්, සොරුගෙන්, ගින්නෙන්, දියෙන්, ආදියෙන් විනාශ නොවන්නේ නම් එය ආරක්‍ෂා සම්පත්තිය (ආරක්ඛසම්පදා) බව ද ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දී පෙන්වා දෙයි.[9]

දිළින්දා දිළිඳුභාවයෙන් මුදවා ගැනීම සඳහා රජය විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග කිහිපයක් කූටදන්ත සූත්‍රයෙහි එයි. එහි දී කෘෂිකර්මාන්තයේ නියුතු වූවන්ට බිත්තර වී ද, සත්ත්ව පාලනයේ නියුතු වූවන්ට බත් ද, වෙළඳාමෙහි නියුතු වූවන්ට මුදල් ද, රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට වැටුප් ද ලබා ගෙවිය යුතු බව පෙන්වා දෙයි.[10] මෙසේ කටයුතු කිරීමෙන් යහපත් රාජ්‍ය පාලනයක් රට තුළ ස්ථාපිත කළ හැකි බව සූත්‍රය තවදුරටත් පෙන්වා දෙයි.[11]

ඒ අනුව මිනිසුන් තමාට අයිති කාර්යයන් හි නියැලෙමින් ජීවත් වෙමින් රට නොපෙළයි. එමෙන් ම රජ හට බොහෝ ආදායම් ද වෙයි. සොරු නැති, පීඩා නැති රටෙහි වන ජනතාව සතුටින් ජීවත් වන බවත් සිය නිවෙස් හි දොරගුළු නොදමා විවෘත ව තබමින් දරුවන් සමග නිදහසේ හැසිරෙමින් කටයුතු කරන බවත් සූත්‍රය දක්වයි.

අන්ධ සූත්‍රයේ දී පුද්ගලයාගේ උභයාර්ථ දියුණුව ඇස් දෙකට උපමා කොට විග්‍රහ කොට ඇත.[12] එහි එන උභයාර්ථය නම් දෑස ම පෙනෙන මිනිසෙකු තැනීම යි. එනම්ඃ

---

[8] සිඟලා සුත්ත, දී.නි. 3, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 302 පිටුව
භොගෙ සංහරමානස්ස - භමරස්සෙව ඉරීයතො, භොගා සන්නිචයං යන්ති - වම්මිකොʼවූපචීයති.

[9] ව්‍යග්ඝපජ්ජ සුත්ත, අ.නි. 5, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 236 පිටුව
කතමා ච ව්‍යග්ඝපජ්ජ, ආරක්ඛසම්පදාඃ ඉධ ව්‍යග්ඝපජ්ජ, කුලපුත්තස්ස භොගා හොන්ති උට්ඨානවිරියාධිගතා බාහාබලපරිචිතා සෙදාවක්ඛිත්තා ධම්මිකා ධම්මලද්ධා, තෙ ආරක්ඛෙන ගුත්තියා සම්පාදෙති.

[10] කූටදන්ත සූත්‍රය. දී.නි. 1, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 262 පිටුව
තෙන හි භවං රාජා යෙ භොතො රඤ්ඤො ජනපදෙ උස්සහන්ති කසීගොරක්ඛෙ, තෙසං භවං රාජා බීජභත්තං අනුප්පදෙතු. යෙ භොතො රඤ්ඤො ජනපදෙ උස්සහන්ති වණිජ්ජාය, තෙසං භවං රාජා පාභතං අනුප්පදෙතු. යෙ භොතො රඤ්ඤො ජනපදෙ උස්සහන්ති රාජපොරිසෙ, තෙසං භවං රාජා භත්තවෙතනං පකප්පතු.

[11] කූටදන්ත සූත්‍රය. දී.නි. 1, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 262 පිටුව
තෙ ච මනුස්සා සකම්මපසුතා රඤ්ඤො ජනපදං න විහෙඨෙස්සන්ති. මහා ච රඤ්ඤො රාසිකො භවිස්සති, ඛෙමට්ඨිතා ජනපදා අකණ්ටකා අනුප්පීළා. මනුස්සා ච මුදා මොදමානා උරෙ පුත්තො නච්චෙන්තා අපාරුතඝරා මඤ්ඤෙ විහරිස්සන්ති.

[12] අන්ධ සුත්ත, අ.නි. 1, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 238 පිටුව
කතමො ච භික්ඛවෙ පුග්ගලො ද්විචක්ඛුඃ ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස තථාරූපං චක්ඛු හොති, යථාරූපෙන චක්ඛුනා අනධිගතං වා භොගං අධිගච්ඡෙය්‍ය, අධිගතං වා භොගං ඵාතිකරෙය්‍ය තථාරූපම්පිස්ස චක්ඛු හොති, යථාරූපෙන චක්ඛුනා කුසලාකුසලෙ ධම්මෙ ජානෙය්‍ය, සාවජ්ජානවජ්ජෙ ධම්මෙ ජානෙය්‍ය, හීනප්පණීතෙ ධම්මෙ ජානෙය්‍ය, කණ්හසුක්කප්පටිභාගෙ ධම්මෙ ජානෙය්‍ය.

1. ආර්ථික හෙවත් භෞතික දියුණුව

2. සදාචාර හෙවත් ආධ්‍යාත්මක දියුණුව යි.

ඒ අනුව, ඇස් දෙක ම ඇති පුද්ගලයා යනු මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙකුට යම්බඳු වූ ඇසකින් නොලද වස්තුව ලබන ආකාරය පිළිබඳව ඇති ඇස ද ලද වස්තුව වැඩි දියුණු කරගන්නා ආකාරය පිළිබඳව ඇති ඇස ද යන ඇස දෙක ම ඇත්තේ යමෙකුට ද ඒ ඇස් දෙකම ඇති පුද්ගලයා යි. එමෙන් ම යම්බඳු වූ ඇසකින් කුසලාකුසල ධර්මයන් දන්නා වූ ද, උස් පහත් ධර්ම දන්නා වූ ද කුසලාකුසල ධර්මයන්ට සමාන කොටස් ඇති ධර්මයන් දන්නා වූ ද ඇස ද ඇත්තේ ද වෙයි.

මෙතෙක් සඳහන් කරන්නට යෙදුණු සූත්‍රාගත විග්‍රහයන්ට අනුව බෞද්ධ ධනෝපාර්ජනය තිරසර සංවර්ධනයක් සඳහා යොදා ගත හැකි බවත් එමගින් ජීවී අජීවී පරිසරය සුරක්ෂිත වන බවත් යහපත් පුද්ගල පෞරුෂයක් ගොඩනගා ගැනීම සඳහා එකී ක්‍රමෝපායයන් බෙහෙවින් උපකාරී වන බවත් පෙන්වා දිය හැකිය.